

# 2015

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

වාර්ෂික වාර්තාව, ගිණුම් ප්‍රකාශන සහ විගණකාධිපතිගේ වාර්තාව

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2015

# වාර්ෂික වාර්තාව

**2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 48 වෙනි වසර සඳහා**

**2015 ජනවාරි මස 01 වෙනි දින සිට**
**2015 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා**

## දැක්ම

මුද්‍රණ කර්මාන්තයේ
ප්‍රමුඛයාවීම සමගින්
ප්‍රකාශනයෙන් විශේෂයෙන්
අධ්‍යාපන සංවර්ධන
ප්‍රකාශනයෙන්,
සුරක්ෂා මුද්‍රණ කර්මාන්තය,
අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය
නිෂ්පාදන වෙළඳපොළේ
පුරෝගාමියා වීම.

## මෙහෙවර

දක්ෂ, නිපුණ, ධෛර්යමත්
හා තෘප්තිමත්
සේවක මණ්ඩලයකින් සමන්විත
ආදර්ශමත් රාජ්‍ය සංස්ථාවක්
ලෙස මුද්‍රණ කර්මාන්තයේ
උසස්ම ප්‍රමිතියට අනුව
තරඟකාරී මිලකට
මුද්‍රිත නිෂ්පාදන
ජනතාවගේ අවශ්‍යතාවය හා
උන්නතිය සඳහා
සැපයීමට කැපවෙනු ඇත.

පානළුව,
පාදුක්ක.

ගරු රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යතුමා
රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශය
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 07.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන

03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී
රවින්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# සභාපතිතුමාගේ පණිවුඩය



ලංකාව තුළ මුද්‍රණ කර්මාන්තයේ පෙර ගමන්කරු ලෙස ජන්මලාභය ලැබ 1968 වර්ෂයේ සිට මොහොතින් මොහොත පෙරමග තුළ ජයග්‍රහණය ලබමින් වර්ෂ 47ක කාල පරාසය තුළ සියලු බාධක පරයමින් පැමිණි ගමන්මග දෙස විමසා බැලීමේදී නිමා වූ තවත් කෙටි කාල පරාසයක් වෙනුවෙන් සැකසෙන 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට, ලාංකීය සමාජය හමුවේ තැබීමට හැකිවීම පිළිබඳ මා සතුටට පත්වෙමි.

යහපාලනය පෙරදැරි කර ගනිමින් සම්මුතිවාදී පාලනයක් දැයට දායාද කළ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අභිනව රාජ්‍ය පාලනයේ සාර්ථක ගමන සඳහා අපට දායකත්වය සැපයීමට හැකිවීම අපගේ මෙන්ම දේශයේ ඉදිරි ගමනට අත්වැලක් වනු නොඅනුමානය. එමෙන්ම පසුගිය කාලය තුළ පසුබෑමට ලක් වූ අප, වෙළඳපළ තුළ නැවත ස්ථාන ගත වෙමින් අතිප්‍රමාණික ලාභ සංකල්පයෙන් බැහැර පූර්ණ තරගකාරී වෙළඳපළ තුළ ප්‍රමාණික ලාභ සංකල්පය හරහා වැඩි ව්‍යාපාරික අවස්ථා උදාකර ගනිමින් ආයතනයේ මූල්‍ය ප්‍රතිලාභයන් තව තවත් වර්ධනය කරමින් මෙතෙක් පවත්වා ගෙන ආ ක්‍රමවේදය වඩාත් වේගයෙන් පෙරට ගෙන යාමට අත්පොත් තැබූ මොහොතක සමාජයේ යහපත උදෙසා විනිවිද දකින පරිදි පසුගිය කාල පරාසය වෙනුවෙන් සංස්ථාවේ ගමන් මග හෙළි කරන වාර්ෂික වාර්තාව ඉදිරිපත් වීමද සතුටකි.

අතීතයේ පැවති විවිධ හැලහැප්පීම් බාධක පරයමින් තරගකාරී වෙළඳපළ තුළ හුදකලා වූ තැන් නිවැරදි කරමින් ලංකාවේ මුද්‍රණයේ පෙර ගමන්කරු ලෙස ලද විරුදාවලිය අනාගතය වෙනුවෙන් ආරක්ෂා කරමින් ශක්තිමත් දැවැන්තයෙකු බිහිකරන සිහිනයක් සහිත ගමනක් සඳහා පියවර ක්‍රියාත්මක කරනු ලබන මොහොතක එම ගමන් මග සාර්ථක කරන්නට යුගයේ විශිෂ්ට මෙහෙවර වෙනුවෙන් කැප වූ යහපාලන සම්මුතිවාදී රාජ්‍ය පාලනයේ ප්‍රධාන මෙහෙයුම්කරුවන් වන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආදරයෙන් ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම එතුමන්ගේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය තුළින් අප ගමන් මග එළි පෙහෙළි කරන්නට නිතිපතා දායකත්වය සපයමින් අප නිසි මගට යොමු කළ ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා හා නියෝජ්‍ය අමාත්‍ය කරුණාරත්න පරණවිතාන මැතිතුමා ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

ආයතනයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් යා යුතු නිවැරදි දිසාව තෝරා බේරා දෙමින් අප කෙරේ විශ්වාසයෙන් කටයුතු කරන අමාත්‍යාංශ ලේකම් නිමල් බෝපගේ මැතිතුමා සහ අප සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෙට දින ගොඩනගන්නට මා වෙත ලබාදෙන ශක්තිය ද ගෞරවයෙන් සිහිපත් කරන අතර, ලංකාවේ මුද්‍රණයේ පෙර ගමන්කරු ලෙසට ශක්තිය දෙමින් සාමූහික හැඟීමෙන් ශක්තිමත් අත්වැලක් තනා ඇති සංස්ථාවේ සමස්ත සේවක මඬුල්ල ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

**රවින්ද්‍ර යසලාල් කලන්සූරිය**
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2015

## අධ්‍යක්ෂ මණ්ඩලය

**සභාපති**

රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

නැණසේන ආදිහෙට්ටි මහතා

**අධ්‍යක්ෂ**

1. ඩබ්ලිව්. කේ. ඩී. ඩන්ස්ටන් මහත්මිය
2. ඩබ්ලිව්. ඒ. ඩී. එස්. ගුණසිංහ මහතා
3. ජී. එම්. නීල් ගුණදාස මහතා
4. බන්දුල ගුරුසිංහ මහතා
5. දර්ශන පොන්නම්පෙරුම මහතා

# 2015

# විධායක නිලධාරී මණ්ඩලය

**සාමාන්‍යාධිකාරී**
ආර්. එම්. එන්. මොණරව්ල මහතා

**මුදල් කළමනාකරු**
එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා

**වැඩ කළමනාකරු**
එස්. ටී. කරුණාරත්න මහතා

**සැපයුම් කළමනාකරු**
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

**කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර මහතා

**අලෙවි කළමනාකරු**
එම්. ටී. ජේ. පෙරේරා මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ඩී. එම්. එම්. බී. දිසානායක මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

**නියෝජ්‍ය මුදල් කළමනාකරු**
කේ. එච්. තිලකරත්න මහතා

**කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)**
එල්. ටී. ප්‍රේමසිරි මහතා

**ගණකාධිකාරී**
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

**ගණකාධිකාරී**
ඩබ්. එල්. දෙනියගේ මහතා

**අභ්‍යන්තර විගණක**
ඒ. එස්. සී. සිල්වා මහතා

**සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)**
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

**සහකාර කළමනාකරු වැඩ (සුරක්‍ෂා)**
එම්. ඒ. කොතලාවල මහතා

**සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)**
එස්. ඩී. කුමාරසිංහ මහතා

**සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)**
එම්. ඒ. ශාන්ත කුමාර මහතා

**සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)**
පී. කේ. තිලක් මහින්ද මහතා

**සහකාර කළමනාකරු (විකුණුම්)**
එච්. ආර්. ගුණසේකර මහතා

**සහකාර කළමනාකරු (ආරක්‍ෂක)**
ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා

**සහකාර කළමනාකරු**
**(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
කේ. එච්. බී. සජීව මහතා

# 2015 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 48 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.


සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වන ලදී

## 01. නිෂ්පාදනය


### 1.1 පාසල් පෙළ පොත්

### 1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමු වී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය සෘජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2014 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2015 වසරේදී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 9.1ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රු. මිලියන 735,111ක ආදායමක් ලැබුණි.
සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2013 හා 2014 ට සාපේක්ෂව පහත දැක්වේ.





| පාසල් මුද්‍රණ වැඩ | 2013 ('000) | 2014 ('000) | 2015 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 8,546 | 8,406 | 9,110 |
| ආදායම - රු. | 758,335 | 789,897 | 735,111 |





### 1.2 වෙනත් මුද්‍රණ සේවා

සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය, ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, රිදී රේඛා, බැංකු තැන්පත් සහතික පත්, තැපැල් පාස්පොත්, ලේබල්, එයාපෝර්ට් සුපර් බ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදි. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදි. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදි. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

## 1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා




ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය ද දැනට වසර 40ක පමණ කාලයක් මුද්‍රණය කරනු ලැබේ. මීට අමතරව පවර් ලොටෝ සහ නීරෝගා ලොතරැයියද මුද්‍රණය කරනු ලැබේ. 2015 වර්ෂයේ විශේෂිත ලොතරැයියක් ලෙස ඩබල් බෝනස් ලොතරැයිය ද මුද්‍රණය කරන ලදි. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කර දුන් අතර 2015 වසරේදී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 283කි. ඒ අනුව ආදායම රු. මිලියන 163ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.




| ලොතරැයි මුද්‍රණ වැඩ | 2013 ('000) | 2014 ('000) | 2015 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 242,991 | 244,655 | 283,329 |
| ආදායම - රු. | 136,124 | 137,007 | 163,497 |

## 1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදි. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදි.

01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ කටයුතු
03. විශ්වවිද්‍යාල සහතික පත්
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු (රිදී රේඛා සහතික පත්)
08. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්
09. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අයත් මුද්‍රණ කටයුතු


සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 118.4 කි.


### 1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය

ලිපිද්‍රව්‍ය අංශයේ සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව 2013 හා 2014 වසරවල නිෂ්පාදනය පහත පරිදි වේ.

| අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් | 2013 රු.('000) | 2014 රු.('000) | 2015 රු.('000) |
|---|---|---|---|
| පොත් පිටපත් සංඛ්‍යාව | 10,141 | 8,615 | 11,147 |
| ආදායම - රු. | 228,563 | 204,210 | 251,600 |

අපේක්ෂිත අභ්‍යාස පොත් තොග ගබඩා කර තබා ගැනීම සඳහා පැවති ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා 2015ට අදාල රු. මිලියන 13,441ක නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.








## 02. අලෙවි හා විකුණුම්

2015 වර්ෂයේදී සමස්ත අලෙවි ආදායම පෙර වසරට සාපේක්ෂව රු. 8,427,719.00 කින් අඩු වී ඇත.

| වර්ෂය | 2013 රු. | 2014 රු. | 2015 රු. |
|---|---|---|---|
| සමස්ත අලෙවිය | 235,593,167.00 | 250,459,494.00 | 242,031,775.00 |

අපගේ ප්‍රධානතම ආදායම් ප්‍රභවයන් දෙකක් වන අභ්‍යාස පොත් අලෙවිය සඳහා අවශ්‍ය වේගයෙන් අලෙවි වන අත්‍යවශ්‍ය අයිතම කිහිපයක තොග පාසල් වාරය තුළ හිඟවීම නිසා, ඇණවුම් අහිමිවීම සිදුවූ අතර කාර්යාලයීය ලිපිද්‍රව්‍ය අලෙවිය සඳහා සැපයුම් අවශ්‍යතාවය වසර පුරාවටම නිසි ලෙස සිදු නොවීම හේතු කොට ගෙන මෙම ආදායම් අඩුවීම සිදුව ඇත.




### ප්‍රකාශන සේවා

ප්‍රකාශන ආදායම සුළු ලෙස වර්ධනයක් පෙන්නුම් කර ඇතත්, මෙම අංශය මෙහෙයවීමට සුදුසු ප්‍රකාශන කළමනාකරුවෙකු හෝ ප්‍රකාශන නිලධාරියෙකු බඳවා ගැනීම සිදුවී නොමැති අතර ඉදිරියේදී නව ප්‍රකාශන කළමනාකරුවෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇති නිසා ඉදිරි වර්ෂය තුලදී මෙහි සැලකිය යුතු ප්‍රගතියක් අපේක්ෂා කල හැක.

# 03. ස්ථාවර වත්කම්

2015 වර්ෂය අවසානයේදී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 397,197,548/= ක් විය. එහි ශුද්ධ වටිනාකම රු. 99,679,966/= කි. මෙම තත්ත්වය මීට පෙර, එනම් 2014 වසර හා සැසඳීමේදී පිළිවෙළින් රු. 375,101,361/= ක් හා රු. 93,143,947/= ක් වශයෙන් විය.

| ස්ථාවර වත්කම් | 2013 රු.('000) | 2014 රු.('000) | 2015 රු.('000) |
|---|---|---|---|
| ආරම්භක වටිනාකම (පිරිවැයට) | 337,870 | 365,513 | 375,101 |
| වර්ෂ අවසාන ශුද්ධ වටිනාකම | 99,983 | 93,143 | 99,680 |

# 04. බදු බැඳියාව


සංස්ථාව තක්සේරු වර්ෂ 2015/2016 සඳහා ආදායම් බදු වශයෙන් රු. 821,094/- ක මුදලක් සංස්ථාවේ 2015 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට ඇත.

| බදු බැඳියාව | 2013 රු. ('000) | 2014 රු.('000) | 2015 රු.('000) |
|---|---|---|---|
| ආදායම් බදු | 30,828 | 27,260 | 821 |
| ලාභාංශ බදු | 5,454 | 2,363 | - |
| එකතුව | 36,282 | 29,623 | 821 |

# 05. ලාභය

2015 වසර තුළදී සංස්ථාව රු. 2,932,478/= ක බදු පූර්ව ලාභයක් උපයා ඇති අතර, එය 2014 වසරේදී රු. 71,153,661/= ක් විය.


| ලාභදායිතාව | 2013 රු. ('000) | 2014 රු.('000) | 2015 රු.('000) |
|---|---|---|---|
| බදු පූර්ව ලාභය | 78,096 | 71,154 | 2,932 |
| බදු ප්‍රතිපාදනයෙන් පසු | 41,813 | 41,531 | 2,111 |



## 06. ප්‍රසාද දීමනා

වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් සුදුසුකම් ලැබූ සේවකයින් සඳහා මාස 02ක වැටුපකට සමාන මුදලක් ගෙවන ලදි. එසේ ගෙවන ලද මුළු ප්‍රසාද දීමනාව රු. 50,660,006/= කි. 2014 වසරට සාපේක්ෂව 24% ක වර්ධනයකි.

| ප්‍රසාද දීමනා | 2013 රු. ('000) | 2014 රු. ('000) | 2015 රු. ('000) |
|---|---|---|---|
| | 35,260 | 40,724 | 50,660 |




## 07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදි. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුදල රුපියල් මිලියන 120 ක් විය.

| | සුභ සාධනය | 2013 රු.('000) | 2014 රු.('000) | 2015 රු.('000) |
|---|---|---|---|---|
| 01. | සේවක ප්‍රවාහන පහසුකම් | 3,064 | 3,274 | 2,595 |
| 02. | සේවක දිරි දීමනා ගෙවීම් | 5,872 | 5,804 | 5,904 |
| 03. | වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම | 5,542 | 4,856 | 6,018 |
| 04. | සේවක විවිධ සුභ සාධනය | 17,845 | 27,016 | 24,703 |
| 05. | කම්කරු වන්දි ආරක්ෂණය | - | 216 | 228 |
| 06. | සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම | 1,132 | 1,146 | 1,251 |
| 07. | සේවක ප්‍රසාද දීමනා | 35,260 | 40,724 | 50,660 |
| 08. | සේවක නිවාස ණය ප්‍රතිපූරණය | 4,207 | 4,935 | 4,938 |
| 09. | සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් | 11,319 | 13,051 | 16,939 |
| 10. | විශේෂ දිරි දීමනා | 3,495 | 3,408 | 6,700 |
| | එකතුව | 87,736 | 104,430 | 119,891 |

## 08. සේවක මණ්ඩලය

2015. 12. 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 694 කි.

| සේවක සංඛ්‍යාව | 2015 |
|---|---|
| කාර්යාලය | 142 |
| ප්‍රධාන මුද්‍රණාලය | 371 |
| ලිපිද්‍රව්‍ය කම්හල | 55 |
| ආරක්ෂක අංශය | 46 |
| අලෙවිසැල් | 40 |
| අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් | 23 |
| දෛනික වැටුප් ලබන කම්කරුවන් | 17 |

**2015 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ නිලධාරීන්**

| | නම/තනතුර | දිනය |
|---|---|---|
| 1. | කේ. ඒ. ඒ. ඩී. ජුඩ් පීටර් මයා<br>- සහකාර කළමනාකරු වැඩ (නඩත්තු) | 2015.02.26 |
| 2. | එල්. ජී. හේවාවිතාරණ මයා<br>- මෙහෙයුම් කළමනාකරු | 2015.05.24 |
| 3. | ඒ. එස්. සී. සිල්වා මයා<br>- අභ්‍යන්තර විගණක | 2015.12.31 |

## සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 2015 දෙසැම්බර් 31 වැනිදා වන විට

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### 1.1 පොදු තොරතුරු

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි.
පාදුක්ක පානළුව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළපොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන්.

## 2. සැකසුම සඳහා වන පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

### 2.1 ඇගයුම සඳහා වන පදනම

උපචිත පදනම හා අතීත වැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ.
ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ එකතු කරන ලද ක්ෂයවීම් පිළිබඳ ශුද්ධ වැය යටතේ සඳහන් කර ඇත.

මුළුමනින්ම ක්ෂය වී ඇති එහෙත් තවමත් භාවිත කරන වත්කම්

| වත්කම් වර්ගීකරණය | මුළු පිරිවැය (රු.) | මුළුමනින්ම ක්ෂය වී ඇති දේපළවල වටිනාකම (රු.) | මුළුමනින්ම ක්ෂය වී ඇති දේපළවල වටිනාකම % ලෙස සමස්ත දේපළවල වටිනාකමින් |
|---|---|---|---|
| ගොඩනැගිලි | 38,020,440.00 | 6,683,778.00 | 18% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 236,452,325.00 | 128,705,002.00 | 54% |
| ලී බඩු හා සවිකිරීම් | 4,410,226.00 | 3,519,360.00 | 80% |
| මෝටර් රථ | 45,807,299.00 | 20,746,499.00 | 45% |
| කාර්යාලයීය උපකරණ | 31,450,774.00 | 10,887,819.00 | 35% |
| විද්‍යුත් ප්‍රතිස්ථාපන | 2,572,951.00 | 2,572,951.00 | 100% |
| පරිගණක මෘදුකාංග | 35,793,321.00 | 26,918,031.00 | 75% |

ඉහත වර්ගීකරණය කර ඇති වත්කම් 2015. 12. 31 දිනට තවදුරටත් භාවිතයට ගත හැකි කාලය තක්සේරු කරමින් පවතින අතර මනා ගිණුම්කරණ සැලැස්මකින් අවශ්‍ය පියවර ගනු ඇත.

#### 3.1.1 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ජීව ගුණය පිළිබඳ සෘජු තක්සේරුවකින් පසු ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ජීව ගුණ වර්ෂ පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 13.33 යි |
| මෝටර් හා වෙනත් වාහන | වසර 04 යි |
| ලී බඩු හා සවිකිරීම් | වසර 10 යි |
| කාර්යාලයීය උපකරණ | වසර 10 යි |
| පරිගණක හා උපාංග | වසර 03 යි |
| කර්මාන්තශාලා උපකරණ හා අකුරු | වසර 04 යි |

### 3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

### 3.3 බදුකරණය

බදුකරණ ක්‍රමවේදය හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව සිදු කර ඇත.

### 3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

# 4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

### 4.1 මූල්‍ය වත්කම්

#### 4.1.1 මූල්‍ය වත්කම් අපහායනය

(a) වෙළඳ ලැබීම් 2.5 මත ලබා දී ඇත.
(b) නියමිත කාල පරිච්ඡේදය ඇතුළත දී සමස්ත පෙළපොත් සංඛ්‍යාවම සැපයුම් නොකරන ලදී. ඒ නිසා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් නොලැබුණු මුදල් ප්‍රමාණය ඉදිරියේදී සැපයීම සිදු කරනු ලබයි. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පැනවූ දඩ ප්‍රමාණය පසුගිය අවුරුදු 5 තුළ වූ සාමාන්‍ය මත පදනම් විය.

### 4.2 මූල්‍ය බැඳුම්කර

සංස්ථා මූල්‍යකරණයේ මාධ්‍ය මහජන බැංකුවෙන් ලබා ගත් ණය පැකේජයකි. ඉඩම්, ගොඩනැගිලි හා ස්ථාවර යන්ත්‍රෝපකරණ පදනම මත එය ලබා ගෙන ඇත.
පසුගිය කාලයේ සේවක භාරකාර අරමුදලේ අධි අය සඳහා බැඳුම්කරයක් ඇත.

#### 4.2.1 අසම්භාව්‍ය බැරකම්

කම්කරු විනිශ්චය සභාව විසින් දෙනු ලැබූ තීන්දුවකට එරෙහි අභියාචනා 7ක් ද, මහාධිකරණයට කර ඇති අභියාචනා 17 ක් ද, දිස්ත්‍රික් උසාවියට කර ඇති පැමිණිලි 3ක් ද, අභියාචනා අධිකරණයට කර ඇති පැමිණිල්ලක් ද හමුවේ අසම්භාව්‍ය බැරකමක් සංස්ථාවට ඇත.

# 5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

1983 අංක 12 දරන අර්ථසාධක පනත යටතේ අර්ථසාධක ගෙවීමට සංස්ථාව බැඳී සිටී. අර්ථසාධක ගෙවීම කිසිදු හිඟයකින් තොරව සිදු කෙරිණ. 2015. 12. 31 දිනට අනුව ඇති ප්‍රතිපාදනවලට අනුව වෙනත් අරමුදලක් ස්ථාපනය නොකෙරිණ.

# 6. ආදායම් හා වියදම්

### 6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොලී මගින් ආදායම
සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

### 6.2 වියදම්

වසරේ ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දැරූ වියදම් සියල්ල ආදායම්වලින් අඩු කර ගෙන තිබේ.

### 6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ඉල්ලා ගැනීම් සිදු වූ කාලය තුළ ඒවා වැය ලෙස හඳුනා ගැනේ.

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

| | සටහන | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 15 | 99,679,966 | 93,143,946 |
| | | **99,679,966** | **93,143,946** |
| ජංගම වත්කම් | | | |
| තොගය | 16 | 359,962,298 | 374,745,859 |
| වෙළඳ ලැබීම් | 17 | 656,995,640 | 789,934,471 |
| වෙනත් ලැබීම් | 18 | 183,534,351 | 165,575,584 |
| පූර්ව ගෙවීම් | | 263,396 | 11,704 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 19 | 33,542,417 | 5,425,708 |
| මුළු ජංගම වත්කම් | | 1,234,298,102 | 1,335,693,326 |
| මුළු වත්කම් | | **1,333,978,068** | **1,428,837,272** |
| ස්කන්ධය හා බැරකම් | | | |
| ප්‍රාග්ධන නිකුතුව | | 15,000,000 | 15,000,000 |
| සංචිත | | 15,003,633 | 15,003,633 |
| රඳවා ගත් ඉපයීම් | | 312,036,107 | 321,839,104 |
| මුළු ස්කන්ධය | | **342,039,740** | **351,842,737** |
| ජංගම නොවන බැරකම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 183,734,742 | 151,387,409 |
| දිගු කාලීන ණය සඳහා පොලී | | - | - |
| දඩ සඳහා ප්‍රතිපාදන | | | 23,449,201 |
| | | **183,734,742** | **174,836,610** |
| ජංගම බැරකම් | | | |
| වෙළඳ ගෙවීම් | 20 | 253,548,518 | 338,137,042 |
| වෙනත් ගෙවීම් | 21 | 36,594,068 | 32,346,639 |
| කෙටි කාලීන ණය සඳහා පොලී | | 469,813,626 | 494,970,217 |
| බැංකු අයිරා | | 48,247,374 | 36,704,028 |
| මුළු බැරකම් | | 808,203,586 | 902,157,926 |
| මුළු ස්කන්ධය හා බැරකම් | | **1,333,978,068** | **1,428,837,272** |

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

.........................................

එන්. ඩී. ප්‍රියංකර කුමාර

මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 15, 16 සහ 17 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 19, 20 මෙන්ම 24 සිට 26 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

.........................................

රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති/අධ්‍යක්ෂ

.........................................

නැණසේන ආදිහෙට්ටි
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 16. තොගය | | |
| අමුද්‍රව්‍ය | 201,427,934 | 242,489,191 |
| පාරිභෝගික භාණ්ඩ | 4,361,638 | 4,557,130 |
| අමතර කොටස් | 38,664,242 | 36,680,545 |
| දෘඩාංග | 1,615,946 | 500,029 |
| නිමි තොගය | 74,921,195 | 59,872,687 |
| නොනිමි තොගය | 38,971,343 | 30,646,277 |
| | **359,962,298** | **374,745,859** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 17. වෙළඳ ලැබීම් | | |
| වෙළඳ ණයගැතියෝ | 673,119,568 | 809,256,090 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | (16,827,989) | (20,231,402) |
| වෙනත් ණයගැතියෝ | 704,061 | 909,782 |
| | **656,995,640** | **789,934,471** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 18. වෙනත් ලැබීම් | | |
| සේවක ණය හා අත්තිකාරම් (සටහන 18.1) | 18,533,893 | 20,964,497 |
| තැන්පතු හා ලැබීම් (සටහන 18.2) | 2,940,778 | 5,746,572 |
| විකුණුම් පාලන ගිණුම | 1,359 | (1,443,477) |
| බැංකු ණය | 162,058,321 | 140,307,992 |
| | **183,534,351** | **165,575,584** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 18.1 සේවක ණය හා අත්තිකාරම් | | |
| ණය හිමි අත්තිකාරම් ගිණුම | 1,920,140 | 1,521,556 |
| ආපදා ණය | 14,294,108 | 16,193,582 |
| උත්සව අත්තිකාරම් | 2,236,000 | 2,756,413 |
| සේවක වැටුප් අත්තිකාරම් | 83,645 | 492,945 |
| | **18,533,893** | **20,964,497** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 18.2 තැන්පතු හා ලැබීම් | | |
| තැන්පතු සඳහා ලැබීම් | 2,406,142 | 5,193,075 |
| අමතර වෙනත් ලැබීම් | 534,636 | 553,497 |
| | **2,940,778** | **5,746,572** |

| | | |
|---|---|---|
| 19. මුදල් හා මුදල්වලට සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | 26,669,359 | 2,214,824 |
| මාර්ගස්ථ මුදල් | 6,774,493 | 3,129,182 |
| අතැති මුදල් | 98,565 | 81,702 |
| | **33,542,417** | **5,425,708** |

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| බැංකුවේ ඇති මුදල් | 26,669,359 | 2,214,824 |
| මාර්ගස්ථ මුදල් | 6,774,492 | 3,129,182 |
| අතැති මුදල් | 98,565 | 81,702 |
| | 33,542,416 | 5,425,708 |
| බැංකු අයිරා | (48,247,374) | (36,704,028) |
| | **(14,704,958)** | **(31,278,320)** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 20. වෙළඳ ගෙවීම් | | |
| වෙළඳ ණය හිමියන් | 53,840,285 | 59,781,032 |
| වෙනත් ණය හිමියන් | 1,076,244 | 77,517,303 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 198,618,612 | 200,835,799 |
| විකුණුම් අත්තිකාරම් | 13,377 | 2,909 |
| | **253,548,518** | **338,137,042** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 21. වෙනත් ගෙවීම් | | |
| උපචිත වියදම් | 35,878,568 | 29,969,046 |
| තැන්පතු ගෙවීම් | 715,500 | 2,377,593 |
| | **36,594,068** | **32,346,639** |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | 2,932,478 | 71,153,661 |
| බදු පෙර ලාභය | | | |
| ගැළපීම්: | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | | 18,817,930 | 16,428,062 |
| පෙර වර්ෂයේ ගැළපීම් | | 63,950,712 | 86,702,069 |
| මූල්‍ය වියදම් | | 51,637,119 | 67,498,596 |
| පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන | | 42,083,872 | 26,774,796 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | **179,422,111** | **268,557,184** |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම | | | |
| තොගය (වැඩිවීම) / අඩුවීම | | 14,783,561 | (66,899,253) |
| (වැඩිවීම්)/ වෙළඳ හා වෙනත් ලැබීම් අඩුවීම | | 132,938,831 | (56,654,226) |
| (වැඩිවීම්)/ වෙනත් ලැබීම්වල අඩුවීම | | (17,958,767) | (22,429,821) |
| ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම) | | (80,341,095) | (5,141,550) |
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | **228,844,641** | **(151,124,850)** |
| ගෙවූ බදු | | (100,805,045) | (75,896,011) |
| සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම | | (9,736,539) | (4,798,335) |
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | **118,303,057** | **36,737,988** |
| ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | | |
| දේපළ, පිරියත, උපකරණ මිලදී ගැනීම | | (24,935,984) | (9,588,804) |
| ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම | | **(24,935,984)** | **(9,588,804)** |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම | | | |
| ණයට ගැනුම් සඳහා ගෙවීම් | | (25,156,591) | 50,882,817 |
| පොළී ගෙවීම | | (51,637,119) | (67,498,596) |
| මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම | | **(76,793,710)** | **(16,615,780)** |
| ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ | | **16,573,363** | **10,533,405** |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | | **(31,278,320)** | **(41,811,725)** |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | සටහන 19 | **(14,704,957)** | **(31,278,320)** |

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
## හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන නිකුතුව රු. | ප්‍රාග්ධන සංචිතය රු. | පොදු සංචිතය රු. | සංවර්ධන සංචිතය රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2014. 01. 01 වැනි දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 283,100,175 | 313,103,808 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | (2,791,741) | (2,791,741) |
| ලාභය/(පාඩුව) වසර සඳහා | - | - | - | - | 41,530,670 | 41,530,670 |
| 2014.12.31 දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 321,839,104 | 351,842,737 |
| 2015.01.01 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **321,839,104** | **351,842,737** |
| පෙර වර්ෂය සඳහා ගැළපීම් | - | - | - | - | (11,914,381) | (11,914,381) |
| ලාභය/(පාඩුව) වසර සඳහා | - | - | - | - | 2,111,384 | 2,111,384 |
| 2015.12.31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **312,036,107** | **342,039,740** |

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| ආදායම | 7 | 1,300,518,508 | 1,334,036,310 |
| විකුණුම් පිරිවැය | 8 | (919,270,372) | (878,824,960) |
| දළ ලාභය | | 381,248,136 | 455,211,350 |
| වෙනත් මෙහෙයුම්වලින් ආදායම | 9 | 25,810,856 | 8,280,234 |
| බෙදාහැරීමේ වියදම් | 10 | (20,637,877) | (28,652,368) |
| පරිපාලන වියදම් | 11 | (221,422,756) | (199,688,025) |
| වෙනත් මෙහෙයුම් සඳහා වියදම් | 12 | (113,405,494) | (98,257,868) |
| මෙහෙයුම් ලාභය | | 51,592,865 | 136,893,323 |
| මූල්‍ය ආදායම | | 2,976,732 | 1,758,935 |
| මූල්‍ය වියදම් | 13 | (51,637,119) | (67,498,596) |
| බදු පෙර ලාභය | | 2,932,478 | 71,153,661 |
| ආදායම් බදු | 14 | (821,094) | (29,622,991) |
| බදු පසු ලාභය | | **2,111,384** | **41,530,670** |

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| වාර්ෂික ලාභය | 2,111,384 | 41,530,669.92 |
| වෙනත් විස්තීරණ ආදායම් | - | - |
| වර්ෂය තුළ මුළු විස්තීරණ ආදායම් | 2,111,384 | 41,530,669.92 |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| 07. ආදායම් | | |
| ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම | 226,772,430 | 231,584,796 |
| ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම | | |
| පෙළපොත් | 776,607,507 | 642,847,478 |
| ජොබ් වැඩ | 281,879,226 | 440,729,338 |
| ප්‍රකාශන | 284,071 | 218,382 |
| වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම | 14,975,274 | 18,656,316 |
| | **1,300,518,508** | **1,334,036,310** |

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| 08. විකුණුම් පිරිවැය | | |
| ප්‍රධාන මුද්‍රණාලය | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 405,558,049 | 429,959,088 |
| සෘජු ශ්‍රමය | 193,528,470 | 157,912,108 |
| සෘජු කර්මාන්තශාලා වියදම් | 43,374,471 | 47,222,425 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 56,591,381 | 54,418,700 |
| අනෙකුත් වියදම් | 30,289,749 | 10,602,024 |
| | **729,342,120** | **700,114,344** |
| ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 154,175,405 | 122,825,306 |
| සෘජු ශ්‍රමය | 29,313,230 | 22,365,113 |
| සෘජු කර්මාන්තශාලා වියදම් | 3,467,847 | 4,048,854 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 2,144,242 | 1,941,292 |
| අනෙකුත් වියදම් | (14,205,944) | 19,345,014 |
| | **174,894,780** | **170,525,579** |
| ප්‍රකාශන අංශයේ පිරිවැය | 393,071 | 225,934 |
| අනෙකුත් අලෙවි අංශවල පිරිවැය | 14,640,401 | 7,959,103 |
| මුළු විකුණුම් පිරිවැය | **919,270,372** | **878,824,960** |

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| 09. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම | | |
| විවිධ ආදායම් | 21,834,295 | 7,498,651 |
| ටෙන්ඩර් තැන්පතු | 599,898 | 781,583 |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | **3,376,663** | - |
| | **25,810,856** | **8,280,234** |

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| 10. බෙදාහැරීම් වියදම් | | |
| ආර්ථික සේවා ගාස්තු | - | 3,260,748 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 15,728,306 | 14,728,700 |
| මෝටර් රථවාහන නඩත්තුව | 3,270,284 | 4,461,840 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | - | 1,466,210 |
| දැන්වීම් සඳහා | 841,008 | 1,453,619 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු | 417,380 | 3,270,984 |
| වෙළඳසැල නඩත්තු කිරීමට | 134,391 | 10,267 |
| විකුණුම් කොමිස් | 246,508 | - |
| | **20,637,877** | **28,652,368** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 11. පරිපාලන වියදම් | | |
| කුලී | 2,715,898 | 3,059,629 |
| ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු | 1,035,120 | 2,327,238 |
| විදුලිය | 167,242 | 195,470 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 310,947 | 432,232 |
| ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ | 1,975,002 | 1,804,769 |
| - ගෘහභාණ්ඩ හා උපාංග | 86,863 | 91,188 |
| - පරිගණක මෘදුකාංග | 2,378,768 | 1,287,337 |
| - යතුරුපැදි | 34,507 | - |
| වරිපනම් | 26,623 | 78,052 |
| ජලය | 38,363 | 49,426 |
| වැටුප් හා වේතන | 124,994,160 | 106,717,208 |
| අතිකාල දීමනා | 7,052,677 | 10,370,043 |
| සේවක අර්ථසාධක අරමුදල | 16,227,899 | 14,264,339 |
| සේවක භාරකාර අරමුදල | 4,056,979 | 3,565,357 |
| දිරි දීමනා | 2,392,750 | 2,540,610 |
| සභාපති වේතනය | 812,065 | 690,000 |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ වේතනය | 510,919 | - |
| උප සභාපති වේතනය | - | 458,347 |
| අධ්‍යක්ෂ ගාස්තු | 213,100 | 288,000 |
| තැපැල් ගාස්තු | 340,305 | 178,089 |
| දුරකථන | 1,239,368 | 1,526,887 |
| පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන | 92,170 | - |
| ප්‍රවාහනය | 1,393,337 | 1,609,818 |
| පුවත්පත් හා වාර සඟරා | 89,020 | 66,910 |
| විදේශ සංචාර / සේවක පුහුණුවීම් (විදේශ) | 672,559 | 3,038,518 |
| අන්තර්ජාල / විද්‍යුත් තැපැල | 80,287 | 412,164 |
| මුද්‍රණ හා ලේඛන | 3,916,882 | 4,733,025 |
| විගණන වියදම් | - | - |
| වින්දනාත්මක කටයුතු | 256,266 | 366,964 |
| නෛතික හා උපදේශන සේවා | 320,719 | 596,557 |
| 25% මෝටර් රථවාහන නඩත්තුව | 3,270,284 | 4,461,840 |
| පොදු කාර්යාලයීය වියදම් | 355,357 | 2,816,822 |
| විවිධ වියදම් | 102,612 | 76,250 |
| පාරිතෝෂික වියදම් | 42,083,872 | 26,774,796 |
| ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම් | 419,000 | 702,550 |
| මුදල් පරිවාර වියදම් | 14,250 | 33,000 |
| සාමාජික ගාස්තු | 36,100 | 37,500 |
| සේවක පුහුණු කිරීම් | 242,100 | 597,850 |
| නවාතැන් පහසුකම් | 13,780 | 254,591 |
| අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම් | 30,667 | 259,268 |
| ආධාර | 335,854 | 1,781,697 |
| මෝටර් රථවාහන කුලී | 443,960 | 1,044,686 |
| අලෙවි විශ්ලේෂණ ගාස්තු | - | - |
| මුදල් ප්‍රවාහන ගාස්තු | 69,675 | - |
| පරිගණක කාර්යංශ සේවා ගාස්තු | 441,450 | - |
| විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු | 133,000 | 99,000 |
| | **221,422,756** | **199,688,025** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 12. වෙනත් මෙහෙයුම් වියදම් | | |
| සේවක සුභසාධනය | 24,702,769 | 27,015,994 |
| සේවක වෛද්‍ය පහසුකම් | 6,017,920 | 4,855,939 |
| නිවාස ණය පොලී | 4,938,620 | 4,935,271 |
| කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා | 50,660,006 | 40,723,833 |
| විශේෂ දිරි දීමනා | 6,700,000 | 3,408,170 |

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ප්‍රවාහනය | 2,595,233 | 3,274,388 |
| නිවාඩු සඳහා ගෙවීම් | 16,937,575 | 13,051,103 |
| උපයන විට ගෙවීම් බදු | 853,371 | 993,171 |
| | **113,405,494** | **98,257,868** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 13. මූල්‍ය වියදම් | | |
| බැංකු ගාස්තු | 6,650,376 | 8,640,167 |
| බැංකු අයිරා පොලී | 1,429,507 | 4,700,100 |
| බැංකු ණය පොලී - කෙටි කාලීන | 43,557,236 | 53,633,209 |
| බැංකු ණය පොලී - දිගු කාලීන | - | 525,121 |
| දඩ ගාස්තු | - | - |
| | **51,637,119** | **67,498,596** |

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| 14. ආදායම් බදු | | |
| වසර සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | 821,094 | 27,259,607 |
| ලාභාංශ බදු සඳහා ප්‍රතිපාදන | | 2,363,384 |
| | **821,094** | **29,622,991** |

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

15 දේපළ පිරියත සහ උපකරණ

| විස්තරය | 2014.12.31 දිනට | ආරම්භක ශේෂයේ වෙනස | වසර තුළදී මිලදී ගැනීම් හා ප්‍රත්‍යාගණය | වර්ෂය තුළදී ඉවත් කිරීම් | 2014.12.31 දිනට ශේෂය | ආරම්භක ශේෂයේ වෙනස | එකතු කිරීම් | වර්ෂය තුළ දී ඉවත් කිරීම් | 2015. 12. 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 475,126 | - | - | - | 475,126 | - | - | - | 475,126 |
| ගොඩනැගිලි | 37,182,060 | - | 838,380 | - | 38,020,440 | - | - | - | 38,020,440 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 215,074,631 | - | 2,168,898 | - | 217,243,529 | - | 19,208,796 | - | 236,452,325 |
| ලී බඩු හා සවිකිරීම් | 4,336,576 | - | - | - | 4,336,576 | - | 73,650 | - | 4,410,226 |
| කාර්යාලයීය උපකරණ | 27,988,509 | - | 1,128,013 | - | 29,116,522 | - | 2,334,252 | - | 31,450,774 |
| කර්මාන්ත උපාංග හා වර්ග | 1,934,576 | - | 30,179 | - | 1,964,755 | - | 250,331 | - | 2,215,086 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,951 | - | - | - | 2,572,951 | - | - | - | 2,572,951 |
| මෝටර් හා වෙනත් වාහන | 48,397,096 | - | - | - | 48,397,096 | (2,839,797) | 250,000 | - | 45,807,299 |
| පරිගණක හා උපාංග | 27,551,031 | - | 5,423,335 | - | 32,974,366 | - | 2,818,955 | - | 35,793,321 |
| එකතුව | **365,512,556** | **-** | **9,588,805** | **-** | **375,101,361** | **(2,839,797)** | **24,935,984** | **-** | **397,197,548** |
| සමුච්චිත ක්ෂය වීම් | | | | | | | | | |
| ගොඩනැගිලි | 27,444,058 | - | 783,417 | - | 28,227,475 | - | 783,417 | - | 29,010,892 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 159,635,834 | - | 6,565,954 | - | 166,201,788 | - | 7,695,826 | - | 173,897,614 |
| ලී බඩු හා සවිකිරීම් | 3,741,128 | - | 91,188 | - | 3,832,316 | - | 86,863 | - | 3,919,179 |
| කාර්යාලයීය උපකරණ | 15,363,113 | - | 1,804,769 | - | 17,167,882 | - | 1,975,002 | - | 19,142,884 |
| කර්මාන්ත උපාංග වර්ග | 1,573,155 | - | 94,127 | - | 1,667,282 | - | 269,021 | - | 1,936,303 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,950 | - | - | - | 2,572,950 | - | - | - | 2,572,950 |
| මෝටර් හා වෙනත් වාහන | 29,913,788 | - | 4,778,107 | - | 34,691,895 | (3,257,762) | 4,855,369 | - | 36,289,502 |
| පරිගණක හා උපාංග | 25,285,326 | - | 2,310,500 | - | 27,595,826 | - | 3,152,432 | - | 30,748,258 |
| එකතුව | **265,529,352** | **-** | **16,428,062** | **-** | **281,957,414** | **(3,257,762)** | **18,817,930** | **-** | **297,517,582** |
| ලියා හල අගය | **99,983,204** | **-** | **-** | **-** | **93,143,947** | **417,965** | **6,118,054** | **-** | **99,679,966** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එම්ආර්ඩී/ඩී/එස්පීසී/1/15/9 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 සැප්තැම්බර් දින.

සභාපති,

රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

**රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්ථාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මකව වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2016 අගෝස්තු 25 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැකසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

---------------------------------

ගිණුම්කරණ ප්‍රමිතිය මගින් අවශ්‍ය කරන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා බැරකම් හිලව් නොකල යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය සහ පුද්ගලික අංශයෙන් අයවිය යුතු රු. 499,251,402 ක්වූ මුළු ණය ශේෂයෙන් රු. 4,409,866 ක මුළු බැර ශේෂය අඩුකර රු. 494,841,536 ක ශුද්ධ ණය ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02

---------------------------------

අවසන් තොගය ගණනය කිරීමේදී, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වූව ද, අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ තක්සේරුවක් සංස්ථාව විසින් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

---------------------------------

(i) සංස්ථාව විසින් ඉකුත් වර්ෂ වලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කිරීම වෙනුවට ගිණුම් වෙනස්වීමේ ප්‍රකාශනය තුළ පෙර වර්ෂයේ ගැලපුම් ලෙස රු. 11.914.381 ක මුදලක් දක්වා තිබුණු අතර ඊට අදාළ තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 200,033,440 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

----------------------------------

ඉඩම්, ගොඩනැගිලි හා යන්ත්‍ර ඇපයට තබා රු. 624,552,578 ක ණය මුදලක් ලබා ගැනීම සම්බන්ධ විස්තර සහ උකසේ ස්වභාවය සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසල් පෙළ පොත් මුද්‍රණය කර නියමිත දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර නොදීම හේතුවෙන් ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ රු. 28,496,348 ක ප්‍රමාද ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 1,586,947ක ක්ෂයවීම් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 2.5 ක් ණයගැතියන් වෙනුවෙන් හානිකරණය ලෙස වෙන්කර තිබුණද, සමස්ත ණයගැතියන්ගෙන් රු.64,551,593 ක් අවුරුදු 5 ඉක්මවා තිබීම නිසා එය අයනොවීමේ සම්භාවිතාවයක් පවතින බැවින් වෙන්කරන ලද ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉතිරි කරගත් නිවාඩු සඳහා ගෙවීම් රු.16,937,575 ක් වුවද උපලේඛනය අනුව එම ශේෂය රු.16,677,834 ක් වූයෙන් රු.259,741 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| | විස්තරය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | වෙළඳ ණයගැතියන් | 673,119,568 | ණයගැති පාලන ගිණුම සහ ණයගැති කේවල ගිණුම් |
| (ආ) | වෙළඳ ණයහිමියන් | 53,840,285 | ශේෂ සනාථ කිරීම්, ණයහිමි කේවල ගිණුම් සහ ණයහිමි පාලන ගිණුම |
| (ඇ) | වෙනත් ණයහිමියන් | 1,076,244 | ලෙජර් ගිණුම් සහ ශේෂ සනාථ කිරීම් |

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 673,119,568 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු. 64,551,594 ක හිඟ ණය ශේෂයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ශේෂය රු.53,840,285 ක් වූ අතර ණයහිමි කාල විශ්ලේෂණයට අනුව වසර 2ත් 5ත් අතර බේරුම් නොකරන ලද ණයහිමියන්ගේ වටිනාකම රු.17,865,079 ක් විය. මෙය මුළු ණයහිමියන්ගෙන් සියයට 33ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජාතික කඩදාසි සමාගමෙන් රු.9,753,427 ක් අයවීමට තිබූ අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු.7,460,675 ක් විය. මෙම ණය ශේෂ තුළ වසර 02 ඉක්මවූ ණය මුදල පිළිවෙලින් රු.7,989,976ක් සහ රු.5,578,142ක් වූ නමුත් මෙම ගණුදෙනු හඳුනාගෙන එම ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත (26) (1) උපවගන්තිය. | එකතු කළ අගය මත බදු මුදල් බදු අය කළ හැකි කාල සීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතුව රු. 35,230,511 ක් වූ එකතු කළ අගය මත බදු 2016 ජනවාරි 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත 4 වන වගන්තිය. | එක් එක් කාර්තුවට අදාළ ජාතිය ගොඩ නැගීමේ බදු මුදල් අදාළ කාර්තුව අවසානයට පසුව එළඹෙන මාසයේ විසිවෙනි දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එකතුව රු. 62,426,710 ක් වූ ජාතිය ගොඩ නැගීමේ බදු 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.7 වගන්තිය. | සංස්ථාවේ නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 853,371 ක් වූ උපයන විට ගෙවීමේ බදු මුදල් සංස්ථා අරමුදලින් ගෙවා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,111,384 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,530,670 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 39,419,286 ක පිරිහීමක් නිරික්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු. 33,517,802 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇති වී තිබුණු අතර 2013 වර්ෂයේ සිට එය ක්‍රමයෙන් අඩුවී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු. 468,656,443 ක් වූ සංස්ථාවේ දායකය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී එය රු. 565,260,550 ක් වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෙර වර්ෂය හා සැසඳීමේදී දළ ලාභ අනුපාතය සියයට 34 සිට සියයට 29 දක්වා අඩු වී තිබුණු අතර සංස්ථාවේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 5 සිට සියයට 0.2 දක්වා අඩුවීම නිසා සංස්ථාවේ ලාභදායීත්වය පිරිහීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ බදුපෙර ලාභය පිරිහීම නිසා පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පොළී ආවරණ අනුපාතය වාර 2.12 සිට වාර 1.1 දක්වා පිරිහී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

----------------

1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත හා එයට පසුව හඳුන්වාදුන් සංශෝධිත පනත් අනුව සාරාංශ කරන ලද සංස්ථාවේ අරමුණු පහතින් දැක්වේ.

(අ) රජය, පළාත් පාලන ආයතන, ලිඛිත නීතියකින් සංස්ථාපිත රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පුද්ගලික ආයතන හෝ පුද්ගලයෙකුගේ මුද්‍රණ හෝ ප්‍රකාශන කාර්යයන් ඉටු කිරීම.

(ආ) ලිපි ද්‍රව්‍ය හා වෙනත් අනුයාත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ, මිලදී ගැනීමේ, විකිණීමේ කාර්යය භාර ගැනීම.

(ඇ) සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන පොත් පත්, අධ්‍යාපනික ආධාරක පුවත්පත් සඟරා හා වෙනත් ප්‍රකාශන විකිණීමේ, බෙදාහැරීමේ, අපනයනය කිරීමේ හා ආනයනය කිරීමේ කාර්යය භාර ගැනීම.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

ක්‍රමවත් අලෙවි සැලසුම් පිළියෙල කිරීමෙන් තොරව ලිපි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හේතුවෙන් රු. 39,518,977 ක් වූ පෙර වර්ෂයේ ලිපිද්‍රව්‍ය අවසන් තොගයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලිපිද්‍රව්‍ය තොගය රු. 17,648,818 කින් එනම් සියයට 44 කින් වැඩි වී තිබුණි.

4.3 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

වෙළඳපොල පුරෝකථනයකින් තොරව නිෂ්පාදන සැලසුම් පිළියෙල කිරීම නිසා 2012 සහ 2013 වර්ෂයන්හි දී නිෂ්පාදනය කරන ලද විකුණුම් මිල රු.4,770,110 ක් වූ අභ්‍යාස පොත් තොගය 2016 ජනවාරි මාසය වන විටත් නොවිකිණී තිබූ අතර වර්තමානයේදී මෙම පොත් තොගය ගුණත්වයෙන් බාල තත්ත්වයට පත්වී තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පැරණි හිඟ ණය අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කොමිස් මුදල් ගෙවීමේ පදනම මත සංස්ථාවේ නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පැරණි ණය ශේෂ අය කිරීම වෙනුවට 2013 සහ 2014 වර්ෂයන්ට අදාල ණය අයකර ගැනීම වෙනුවෙන් රු.246,509 ක කොමිස් මුදල් ගෙවා තිබුණි.

4.5 හඳුනා ගන්නා ලද පාඩු

--------------------------

සංස්ථාවේ පොත් හා ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය කඩදාසි තොග නිසි පරිදි ගබඩා කර නොතිබීම නිසා පිරිවැය රු. 461,037 ක් වූ කඩදාසි තොගයක් හානි වී තිබූ අතර එම තොගය සමාලෝචිත වර්ෂයේදී රු. 93,756 කට අලෙවි කිරීමෙන් රු. 367,281 ක පාඩුවක් සිදුවී තිබුණි.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

----------------------------------------------------------------

විධිමත් පැවරීමකින් තොරව සංස්ථාව සතු ඉඩමෙන් අක්කර 13 රූඩ් 2 පර්චස් 06 ක ප්‍රමාණයක් කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරාදී තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

වෙළඳපොල හැසිරීම නිරීක්ෂණය කිරීම හා වෙළඳපොල පර්යේෂණ සිදු කිරීම සඳහා අලෙවි පර්යේෂණ නිලධාරියකු 2013 නොවැම්බර් 01 දින පත් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු අලෙවි පර්යේෂණයක් සිදුකර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

5.1 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැය ගත වියදම් හා තත්‍ය වියදම් සැසඳීමේදී වියදම් අයිතම 36 කට අදාලව සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

------------------------

මුදල් පොත යාවත්කාලීනව තුලනය කිරීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා මුදල් බැංකු ගත කිරීම සම්බන්ධව මූල්‍ය පාලන පද්ධතියේ අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.

එච්. එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

අය විය යුතු ණය ශේෂයන්ගේ වටිනාකමින් රු. 4,409,866.00 ක බැර ශේෂය අඩු කර පෙන්වා තිබීමේ දෝෂය ඉදිරි වසරේදී ගිණුම්වලින් කපාහැර නිවැරදි ලෙස ණය ගැති ශේෂය පෙන්වනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02

ගබඩාවේ අලෙවිසැල්වල පවතින තොග වාර්ෂිකව දෙසැම්බර් මස 31 වන දිනට සත්‍යාපනය කරනු ලබන අතර, ඒ අනුව පිරිවැය වටිනාකමට මේ දක්වා තොග ගණනය කිරීම සිදු කර ඇත. එළඹෙන වර්ෂයේ සිට එම තොග සමීක්ෂණ ආකෘති පත්‍ර වෙනස් කර අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට තොග සමීක්ෂණ මණ්ඩලයට උපදෙස් දෙනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

(i) මින් ඉදිරියට මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු විස්තර පැහැදිලිව සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින වත්කම් ඇතුළුව සියළු වත්කම් මේ වන විට ප්‍රත්‍යාගණනය කර අවසාන වී ඇත. එහෙත් අදාළ වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නොලද නිසා ගිණුම්වලට ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. 2017 වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ගැලපුම් ගිණුම්වලට ඇතුළත් කිරීමට හැකිවනු ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

(i) මින් ඉදිරියට මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු විස්තර පැහැදිලිව සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අවසාන ගිණුම් පිළියෙල කරන දිනට ප්‍රමාද ගාස්තුව නිශ්චිතව ගණනය කළ නොහැකි වන අතර, ගිවිසුම් ප්‍රකාරව අත්තිකාරම් මුදල් ලබාගැනීමේ ප්‍රමාදයක් පැවතුන විට අමුද්‍රව්‍ය ඇණවුම් කිරීමේ ප්‍රමාදයක් ද ඇතිවනු ඇත. එවිට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව පැහැදිලි කිරීමෙන් අනතුරුව ප්‍රමාද ගාස්තු ලිහිල් කර ගැනීමේ ක්‍රමවේදයන් පවතී. එවැනි අවස්ථාවක ප්‍රමාද ගාස්තු සඳහා පූර්ණ වශයෙන් ප්‍රතිපාදන සිදු නොකරනු ලබයි.

(අ) 2014 වර්ෂයේදී මෝටර් රථ ක්ෂයවීමේ ගිණුමෙහි පැවති වැරදි ක්ෂය ගණනය කිරීමක් සමාලෝචිත ගිණුම් වර්ෂයේදී ද පරිගණකයෙන් ගණනය කිරීමේදී (Formula error) ලබාගෙන තිබූ බැවින් අදාළ වැරදීම සිදු වී ඇත. එම වරද සොයාගෙන ජර්නල් සටහනක් (JV No 160026 මගින්) තබා මෙම වර්ෂයේදී (2016) මේ වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඇ) ඉදිරි ගිණුම් වර්ෂවලදී වසර 5කට වැඩි ණයගැතියන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

වැටුප් අංශය විසින් පිළියෙල කරන ලද පහත සඳහන් වවුචර්පත් සඳහා ඉතිරි නිවාඩු වෙනුවෙන් ගෙවීම් 2015 අවසාන ගිණුමෙහි දක්වා ඇති බව සලකන්න.

| | |
|---|---|
| 2015 වර්ෂයට අදාළ ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් | 16,913,389.42 |
| ඩබ්. එස්. කේ. රත්නායක මහතාට ගෙවීම් (ඉතිරි නිවාඩු) | 46,339.00 |
| වවුචර් මගින් ගෙවීම | 650.00 |
| 2014 වර්ෂයේ වැඩිපුර ගෙවීම් | |
| (2014 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමෙන් පසු) | (22,803.19) |
| මුළු ගෙවීම් | 16,937,575.23 |

මෙහි උපලේඛනයක් ලෙස සඳහන් කර ඇත්තේ නිවාඩු වැටුප් පිළියෙල කළ විට ලබාගත් පරිගණක පිටපතකි. එහි වැරදි නිවැරදි කිරීම් සිදුකර අවසාන ගෙවීම් සිදු කර ඇත. එය උපලේඛනයක් ලෙස සැලකීම නිවැරදි නොවන අතර, ගෙවීම් කිරීමත් 2015 වසරේ නිවාඩු වැටුප් පිළියෙල කිරීමත් නිවැරදිව සිදු කර ඇත.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ණය ගැති පාලන ගිණුම සහ ණය ගැති කේවල ගිණුම් ද ණය හිමි පාලන ගිණුම හා ණය හිමි කේවල ගිණුම් ද අනිකුත් ලෙජර් ගිණුම් හා ශේෂ සනාථ කිරීම් ද මුදල් අංශයේ තිබූ බව සඳහන් කරමි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ණය අය කර ගැනීම සඳහා ගණකාධිකාරී (ආදායම්) යටතේ විශේෂ කාර්ය මණ්ඩලයක් පත් කර මෙම ණය අය කර ගැනීමේ කටයුතු විධිමත් කර ඇත.

(ආ) අදාළ ණය හිමි ශේෂය තුළ වසර 2ක් ඉක්ම වූ ප්‍රමාණාත්මකව ගෙවිය යුතු ණය හිමි ශේෂයක් පවතින බව පිළිගන්නා අතර, එම ශේෂයන්හි නිවැරදිතාව පරීක්ෂා කිරීමෙන් පසුව ගෙවා නිරවුල් කිරීමට හෝ කපා හැරීමට හැකි ඉක්මනින් කටයුතු කරනු ඇත.

(ඇ) ජාතික කඩදාසි සමාගමෙන් ලැබිය යුතු මුදල පෙර වර්ෂවල සිටම තීරණය කර ඇත්තේ ණය හිමි ශේෂය තුලනය කිරීමෙනි. මේ නිසා මෙම තත්ත්වය නිරවුල් කිරීමට අදාළ ආයතන වෙත ද (විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද) ලිඛිතව දන්වා ඇත.

## 2.4 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (26) (1) උප වගන්තිය.

2007 වර්ෂයේ සිට හිඟ සිටි රුපියල් මිලියන 210 කට අධික බදු මුදලක් කොටස් වශයෙන් ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග එකඟතාවයකට පැමිණ සිදු කරමින් පවතී. එහි වාරික මුදල් ගෙවීම මේ වන විටත් ආරම්භ කර ඇත. මේ නිසා ආයතනයට හානියක් නොවන ලෙස මූල්‍ය ද්‍රවශීලනතාවය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පවතී. එහෙයින් අදාළ බදු මුදල් ගෙවීම යම්තාක් දුරට ප්‍රමාද වුවද ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත 4 වන වගන්තිය

මින් රුපියල් මිලියන 54 කට ආසන්න මුදලක් පෙර වර්ෂවල හිඟ සිටි බදු වේ. එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත වාරික වශයෙන් ගෙවීම දැනටමත් ආරම්භ කර ඇත. සමස්ථ හිඟ සිටි බදුමුදලින් රුපියල් මිලියන 41.7 ක වාරිකයක් 2016 ජනවාරි මස අවසාන වන විට ගෙවා ඇත.

(ඇ) 2016 ජුනි මස සිට අදාළ නිලධාරින් විසින් උපයන විට ගෙවීමේ බදු මුදල් පුද්ගලිකව ගෙවීමට කටයුතු යොදා තිබේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

විකුණුම් පිරිවැයේ වැඩිවීම සහ පොදු කාර්ය පිරිවැයේ වැඩිවීම සෘජුවම පාරිභෝගිකයන් මත (ඇස්තමේන්තුවලට) ඇතුළත් කිරීම අපහසුවීමත්, මුද්‍රණ කර්මාන්තය සඳහා පවතින දැඩි තරගකාරීත්වයත් ටෙන්ඩර් පටිපාටියට අනුව මුද්‍රණ ඇණවුම් ලබා ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කළ යුතු වීමත් සහ සමස්ත ආදායමෙන් වැඩි කොටසක් වර්ෂයේ අවසාන කාර්තුවේ පමණක් ලැබීමත් යන කරුණු මූල්‍ය ප්‍රතිඵල අයහපත් වීමට බලපා ඇත.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මෙම තත්ත්වය සැලකිල්ලට භාජනය කර තිබේ.

(ආ) පොලී ආවරණ අනුපාතය ප්‍රශස්ත මට්ටමක තබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) සිට (ඇ) දක්වා අරමුණු කෙරේ අවධානය යොමු කර ඇත.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සාමාන්‍යාධිකාරිතුමාගේ අධීක්ෂණයට යටත්ව අලෙවි කළමනාකරු විසින් ක්‍රමවත්ව අලෙවි සැලසුමක් සැකසෙමින් පවතී.

### 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2012 සහ 2013 වසරවලදී විවිධ හේතු නිසා නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තොග ප්‍රමාණවත් ලෙස නොලැබීම නිසා අත්‍යවශ්‍ය අයිතම නොතිබීම මත සෙමින් අලෙවිවන අයිතම ඉතිරි විය.

මෙම ඉතිරි වූ තොගවලින් වැඩි ප්‍රමාණයක් කටු ගසන අයිතම හා වසර අවසාන කාලයේදී වේගයෙන් අලෙවි වන හා සාපේක්ෂව සෙමින් අලෙවිවන අයිතම නිසා කෙටි කාලයක් තුළදී කටු මල බැඳීම වැනි හේතු නිසා ගුණාත්වයෙන් බාලවී අලෙවිවීම ඉතා අඩු විය. කෙසේ වෙතත් 2014 වසරේදී ද අමුද්‍රව්‍ය කඩදාසි තොග ප්‍රමාණවත් පරිදි නොලැබීම මත අත්‍යවශ්‍ය අයිතම නිෂ්පාදනය සීමා වීම නිසා අනෙකුත් අයිතමවල අඩුවීම නිසාත් මෙම අයිතම තවදුරටත් නොවිකිණී ඉතිරි වීම සිදුවිය.

කෙසේ වෙතත් අලෙවිසැල් පිරිසිදු කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර, අලෙවිසැල්වල පවතින පැරණි සහ අබලි වූ පොත් තොග ඉවත් කිරීම සඳහා කමිටුවක් පත් කර පළමුව මිල අඩු කර අලෙවිසැල් හරහාම විකිණීමට හා ඉන් අනතුරුව ඉතිරිවන තොග ප්‍රධාන කාර්යාලයට ගෙන්වා එම තොග විධිමත් ක්‍රමවේදයකට අනුව ඉවත් කිරීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත.

### 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පැරණි හිඟ ණය අයකර ගැනීම සඳහා කොමිස් මුදල් ගෙවීමේ පදනම ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමු කර අනුමත කර ගැනීමට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා දුන් උපදෙස් අනුව කටයුතු කර ඇත.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

අධිකාරි (ගබඩා) විසින් ගබඩාවේ පැවතුණ බැංකු කඩදාසි හා වෙනත් කඩදාසි කීපයකට කාවුන් හානි කිරීම පිළිබඳව කළමනාකරණය වෙත වාර්තා කර තිබුණි. ඒ අනුව සාමාන්‍යාධිකාරිතුමාගේ නිර්දේශය මත 2015.09.01 දින අභ්‍යන්තර විගණන නියෝජිතයෙකු ද ඇතුළත්ව කමිටුවක් පත්කර, භාවිත කළ හැකි කඩදාසි තෝරා මුද්‍රණ කටයුතුවලට ගැනීමටත්, ප්‍රයෝජනයට ගත නොහැකි කඩදාසි අපහරණය කිරීමටත් තීරණය කර ඇත. ඒ අනුව අනෙකුත් කඩදාසි තොග කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට, එම කඩදාසි තොගය ඉක්මනින් ගබඩාවෙන් ඉවත් කරන ලදී. තොග අපහරණය කිරීම ඉහත කමිටු තීරණය අනුව සිදු කර ඇති බව සලකන්න. මේ අනුව අනෙකුත් කඩදාසිවලට සිදුවීමට ගිය විශාල විනාශයක් වළක්වා ගැනීමට හැකි විය.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

සංස්ථා සතු ඉඩමෙන් අක්කර 13 යි රූඩ් 2 යි පර්චස් 06 ක් කාර්මික සංවර්ධන මණ්ඩලයට පැවරීමට කටයුතු කර තිබුණද විධිමත් පැවරීමක් තවදුරටත් අවසන් කර නොමැත.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

අලෙවි පර්යේෂණ නිලධාරියෙකු පත් කර තිබුණ ද එම නිලධාරියා ඉතා කෙටි කලකින් එම තනතුරෙන් ඉවත්ව ගොස් ඇති අතර, ඉදිරියේදී සුදුස්සකු පත්කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය ඵලදායී ලෙස කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු යොදා ඇත.

## 6. පද්ධති හා පාලනයන්

මුදල් පොත තුලනය කිරීමේදී ද බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී ද මුදල් බැංකු ගත කිරීමේදී ද මූල්‍ය පාලන පද්ධතියේ පැවති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

